**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයෙහි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය පූකාශන පිළියෙළ කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම,කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානු වලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරන තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 ජනවාරි 01 සිට කල්පිරෙන තෙක් රඳවාගනු ලබන ආයෝජන සම්බන්ධයෙන් ගිණුම් තැබීම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 - මූල්‍ය උපකරණ (SLFRS 09) අනුගමනය කරමින් සිදුකල යුතු වුවත්, ඒ සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 07 සහ ගිණුම්කරණ ප්‍රමිත 32 හා 39 SLFRS 07 සහ LKAS 32, 39 අනුගමනය කර ඇති බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදාල ගිණුම් තැබීම ශ්‍රී.ලං.ගි.ප්‍ර 39 ට අනුව සිදුකර ඇත. ශ්‍රී.ලං.ගි.ප්‍ර 32 සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර 07 ට අනුව මූල්‍ය ප්‍රකාශන වල අදාල ආයෝජන දැක්වීම සහ හෙළිදරව් කිරීම සිදුකර ඇත. | මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන්ට අනුව ආයෝජන ගිණුම් ගත කිරීම සිදුකල යුතුයි. |
| (ආ) 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ගෙවිය යුතුව තිබූ රු. 6,261,168 ක අධිභාර මුදලක් ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පෙර ලැබී තිබුණත් ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 - වාර්තාකරන දිනෙන් පසුව සිදුවීම් ප්‍රකාරව අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි. | 2019 වර්ෂයේ දී අදාල ගැලපුම් සිදුකිරීමට අපේක්ෂා කරමි. | ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) කාර්යාංශය විසින් දිගුකාලීන සේවා ප්‍රතිලාභ අරමුදලට අදාලව පවත්වාගෙන ගොස් තිබුණු සැලසුම් වත්කමෙහි 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු.151,637,722 ක් විය. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව 2018 වර්ෂයේ දී එය රු. 137,976,269 ක් දක්වා අඩු කර තිබුණි. දිගුකාලීන සේවා ප්‍රතිලාභ අරමුදලකට අදාලව වත්කම් පවත්වාගෙන යාමේ අරමුණ ඉටුවන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 - සේවක ප්‍රතිලාභ (LKAS 19) අනුව මෙම වත්කම් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිතයෙහි පාරිතෝෂික සඳහා ආයෝජනය තබා ගැනීම අනිවාර්ය කර නැත. 2018 වර්ෂයේදී අදාල වගකීම හදුනාගෙන එම වගකීම් නිරවුල් කිරීම සඳහා ද්‍රවශීල සහ ද්‍රවශීල නොවන වත්කම් ගැලපීම සිදුකර ඇත | ආයුගණක තක්සේරු වාර්තාවට අනුව අදාල වගකීම හදුනාගෙන එම වගකීම් නිරවුල් කිරීම සඳහා ද්‍රවශීල සහ ද්‍රවශීල නොවන වත්කම් ගැලපීම කර ඇති බව තහවුරු නොවිය. එබැවින්, සැලසුම් වත්කම කපා හැරීම පිළිබඳ නැවත සලකා බැලිය යුතුය. |
| (ඈ) රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයන් සඳහා ගුවන් ටිකට්පත් මිලදී ගැනීම වෙනුවෙන් කාර්යාංශයට ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු. 1,702,912 ක මුදල සම්බන්ධයෙන් අදාල මූලාශ්‍ර ලියවිලි සහ විස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | විගණන වාර්තාවේ දක්වා ඇති පරිදි රු.11,024,393 ක් වූ විදේශ විනිමය වාසිය අදාල ගිණුම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව 2019 වර්ෂයේදී ගැලපුම් කිරීමට අපේක්ෂා කරමි. | නියැදි පරීක්ෂාවට භාජනය වූ ඉදිරියට ගෙවීම් ගිණුමට මෙන්ම අදාල අනෙකුත් ගිණුම් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 21 ප්‍රකාරව විදේශ විනිමය වාසිය/අවාසිය ගණනය කර ගිණුම්ගත කළ යුතුයි. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයින්ට ගුවන් ටිකට් පත් මිලදී ගැනීම සඳහා අදාල ශ්‍රමිකයන්ගෙන් අයකරන ලද මුදලින් ගුවන්ටිකට්පත් මිලදී ගැනීමෙන් පසු ඉතිරිවූ රු. 2,615,836 ක මුදල අදාල ශ්‍රමිකයින්ට ගෙවිය යුතු ලෙස දැක්වීම වෙනුවට කාර්යාංශයෙහි ආදායමට ගෙන තිබුණි. | කාර්යාංශය විසින් මේ සඳහා පොදු කාර්යය වියදමක් දරන බැවින් මෙම ආදායම එම දරන ලද වියදමේ ප්‍රතිපූර්ණයක් ලෙස සැලකිය හැක. | කාර්යාංශ පනතෙහි 17(3)(ඈ) වගන්තියට අනුව කාර්යාංශයට එක් රැස්වන ආදායම් පොදු කාර්යය වියදම් සඳහා උපයෝගී කර ගත යුතුයි. ඒ අනුව විධිමත් අනුමැතියකින් තොරව විදේශගතවන ශ්‍රමිකයන්ට සපයන සේවාවන් වෙනුවෙන් විවිධ ගාස්තු අයකිරීමේ හැකියාවක් කාර්යාංශයට නොමැත. කාර්යාංශයේ පොදු කාර්ය වියදම් සඳහා එක්රැස්වන අරමුදල් ප්‍රමාණවත් නොවේ නම් ආදායම් රැස්කර ගැනීම සඳහා අවශ්‍ය විධිමත් අනුමැතිය ලබාගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) කාර්යාංශයේ පරිගණකගත ගිණුම් පද්ධතියට අනුව, ලෙජර් ගිණුම්වල ඇතුලත් විදේශ විනිමය හුවමාරු වාසිය රු. 176,892,642 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු. 167,445,298 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව වර්ෂයේ ලාභය රු. 9,447,344 ක් අඩුවෙන් සටහන් වී තිබුණි. | අදාල ගැලපුම් ගිණුම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව 2019 වර්ෂයේ අවශ්‍ය නිවැරැදි කිරිම් සිදුකිරීමට අපේක්ෂා කරමි . | ලෙජර් ගිණුම්වල ශේෂ උපයෝගී කරගෙන මූල්‍ය ප්‍රකාශන පිලියෙල කල යුතුය. |
| (ඇ) කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජන සඵල පොළී අනුපාතික ක්‍රමය මත (Effective Interest Rate) ක්‍රමක්ෂය අගයට මැනීම සිදුකරන බව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් හෙලිදරව් කර තිබුණි. එසේ වුවද, ප්‍රකාශිත පොළී අනුපාතය (Coupon Interest Rate) මත ගණනය කරන ලද පොළිය ආයෝජන ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. | ආයෝජන ආදායම සපල පොලී අනුපාතයට ක්‍රමක්ෂය අගයට මැනීම සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර අදාල ගණනය කිරීම් රජයේ විගණන අංශය වෙත ලබා දී ඇත | පිළිතුර පිළිගත නොහැක. අවසන් ගිණුම් සමඟ ඉදිරිපත් කරන ලද උපලේඛන අංක 7 අනුව ප්‍රකාශිත පොළී අනුපාතය මත ගණනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර පොළිය දක්වා තිබුණි. |
| (ඈ) කාර්යාංශය විසින් විවිධ ණය යෝජනා ක්‍රමයන්ට අදාලව මූල්‍ය ආයතනයන්හි ඇප තැන්පතු වශයෙන් තබා ඇති එකතුව රු. 328,071,264 ක් වූ ස්ථාවර තැන්පතු 10 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි නිසිපරිදි හෙලිදරව් කර නොතිබුණි. | අදාල හෙලිදරව් කිරීම සටහන් අංක 24 යටතේ දක්වා ඇත.නමුත් එකතුව රු.328,071,264 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ හෙලිදරව් කර නොමැත. | අදාල ස්ථාවර තැන්පතු පිළිබඳ තොරතුරු පැහැදිලිව හා නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල සටහන් කල යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂයේ ආදායම් බදු ප්‍රතිපාදනය රු.486,647,581 ක් වුවද විගණනයේදී සිදු කරන ලද ගණනය කිරීම් අනුව එම වටිනාකම රු.476,881,608 ක් වී තිබුණි. ඒ අනුව වර්ෂයේ බදු වියදම රු. 9,765,973 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 01/01/18 දින සිට 31/03/18 දින දක්වා පැරණි දේශීය ආදායම් දෙපාර්තමේතු පනතට අනුව හා 01/04/18 – 31/12/18 දක්වා නව දේශීය ආදායම් දෙපාර්තමේන්තු පනතට අනුව බදු ගණනය කළ අතර ඒ අනුව බදු වියදම් රු. 476,881,608 ක් විය. ඉහත නව බදු ගණනය මගින් සිදු වූ සංශෝධනයන් ඉදිරි වර්ෂයේ නිවැරැදි කරනු ලැබේ. | දේශීය ආදායම් දෙපාර්තමේන්තු පනතට අනුව කාලපරිඡේදයට අදාල බදු ප්‍රතිපාදනයන් නිවැරදිව සිදුකල යුතුය. |

### 1.5.4 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| අධිකාරි බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තර | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කාර්යාංශයේ නිළධාරීන්ට ලබාදෙන වෘත්තීය දීමනා, වාර්ෂික රක්ෂණ දීමනා, ප්‍රසාද දීමනා, විශේෂ ප්‍රසාද දීමනා, ප්‍රවාහන දීමනා, ණය පොලී ප්‍රතිපූර්ණ කිරීම, වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය වැනි දීමනා වලට අමතරව, භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්යාංශය විසින් සකස් කරගත් නිර්ණායක මත ක්‍රම 06 ක් යටතේ එකතුව රු. 86,399,621 ක කාර්ය මණ්ඩල දීමනා ගෙවීමට කාර්යාංශය කටයුතු කර තිබුණි. | මේ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී | දීමනා ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කඩිනම් පියවර ගත යුතුයි. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

| විෂය | මුදල | නොසැපයු විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| (අ)රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයන් සඳහා ගුවන් ටිකට්පත් මිලදී ගැනීම වෙනුවෙන් කාර්යාංශයට ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති මුදල. | 1,702,912 | මූලාශ්‍ර ලියවිලි සහ විස්තරාත්මක උපලේඛන | මෙය ගිණුම් තැබීමේ දෝෂයක් ලෙස හදුනාගෙන ඇති අතර මේ පිළිබඳ තවදුරටත් පරීක්ෂා කර අදාල නිවැරදි කිරීම 2019 වර්ෂයේදී සිදුකිරීමට අපේක්ෂා කරමි. | අදාල තොරතුරු පරීක්ෂා කර සිදුවී ඇති ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) ගෙවිය යුතු ගුවන් ටිකට්පත් ගාස්තු | 2,777,784 | අදාල මූලාශ්‍ර ලියවිලි | මෙය ගිණුම් තැබීමේ දෝෂයක් සේ මූලික වශයෙන් හදුනාගෙන ඇති අතර අදාල නිවැරදි කිරීම 2019 වර්ෂයේදී සිදුකිරීමට අපේක්ෂා කරමි. | අදාල තොරතුරු පරීක්ෂා කර සිදුවී ඇති ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙවිය යුතු වියදම් ලෙස 2015 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙන එමින් පවතින විගමණිකයන්ගෙන් අයකරගන්නා ලද කොරියානු වීසා ගාස්තු රු. 6,640,400 ක් ද, විදේශ රැකියා නියෝජිත ආයතන ලියාපදිංචි ගාස්තුවෙන් නැවත ගෙවිය යුතුව තිබූ එකතුව රු. 149,826,492 ක් ද, තංගල්ල පුහුණු මධ්‍යස්ථානය වෙනුවෙන් ගෙවිය යුතු කුලී රු. 39,060,000 ක් ද, ආහාර සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු රු. 1,776,569 ක් ද, සමාලෝචිත වර්ෂය නිමවන විටත් නිරවුල් කිරීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | දීර්ඝ කාලයක් සිට පැවත එන මෙම ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත** | | | |
| **(i) 52(1) වගන්තිය** | බලපත්‍රලාභියකු විසින් ලබාගත් සෑම කොමිස් මුදලකින්ම සියයට 05 ක අනුප්‍රමාණයක් ගනන් බලනු ලැබූ සෙස් බද්දක් අයකරගත යුතු වුවද, විධිමත් අනුමැතියකින් තොරව විගමනය වන ගෘහ සේවිකාවන්ට විදේශීය හාම්පුතුන්ගෙන් ලැබෙන කොමිස් මුදල නොසලකා එක් විගමණික ගෘහ සේවිකාවක් | කාර්යාංශ පනතේ විධිවිධාන ප්‍රකාරව මෙම බද්ද අය කරනු ලැබුවද බොහෝ අවස්ථාවල විදේශ රැකියා නියෝජිත ආයතන මෙම කොමිස් මුදල් අනාවරණය කිරීමෙන් වැලකෙන බැවින් සහ ඒ පිළිබඳව වැඩිදුර පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් ගෘහස්ථ සේවයේ කාන්තා | විධිමත් අනුමැතියකින් තොරව කාර්යාංශ පනතෙහි සඳහන් විධිවිධාන වලට පටහැනිව විවිධ ප්‍රමාණවලින් ගාස්තු තීරණය කිරීමට කාර්යාංශයට හැකියාවක් නොමැති අතර මේ තුළින් රජයට ලැබිය යුතු ආදායම නියමිත පරිදි අය නොවීම පිළිබඳවද අවධානය යොමු විය යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | වෙනුවෙන් රු.5,000 ක සෙස් බද්දක් අය කර තිබුණි. | ශ්‍රමිකයන් සඳහා රු.100,000 කොමිස් මුදලක් ලැබීම යන පදනමින් මෙම මුදල අයකරනු ලැබේ. | |
| **(ii) 42(2) වගන්තිය** | කම්කරු සුභසාධන අරමුදල ආරම්භ කිරීමේ අරමුණුවලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුල එකතුව රු. 499,473,516 ක් කාර්යාංශයේ සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවා තිබුණි. ඊට අමතරව කාර්යාංශයේ වාර්ෂික පොදු වියදම් වලින් සියයට 5 ක් එනම් රු. 12,018,115 ක් මෙම අරමුදලට හර කර තිබුණි. | විදේශගත ශ්‍රී ලාංකිකයන්ට අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් සේවයේ යෙදවිය යුතු අතර පොදුකාර්ය වියදම් ද දැරිය යුතුව ඇත. ඊට අදාල වියදම් වෙනුවෙන් වාර්ෂිකව කම්කරු සුභසාධන අරමුදලින් කොටසක් ඒ සඳහා වෙන්කරනු ලැබේ. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ආරම්භ කිරීමේ මූලික අරමුණ විගමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය සැපයීමයි. එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදවීමට සහ ඔවුන්ට වැටුප් හා දීමනා ගෙවීමට අවශ්‍ය අරමුදල් සම්පාදනය කරගන්නා ආකාරය පනතේ 13 (7) ඇ වගන්තියේ සඳහන් වේ. ඒ අනුව සේවකයන්ගේ වැටුප් , දීමනා හා පොදු කාර්ය වියදම් කම්කරු සුභසාධන අරමුදලට වැය බරක් නොවිය යුතුය. |
| (iii) **48 (ඇ) වගන්තිය.** | රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයන් පුහුණු කිරීම සහ හුරු කිරීම සඳහා කම්කරු සුභසාධන අරමුදල උපයෝගී කරගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල ඒ සඳහා කිසිඳු මුදලක් වැය කර නොතිබුණු අතර රු. 1,308,838,726 ක් වූ සමස්ථ වියදමෙන් සියයට 22 ක් පමණක් විදේශගත ශ්‍රමිකයින්ගේ සුභසාධනය වෙනුවෙන් වැයකර තිබුණි. | විදේශගත ශ්‍රී ලාංකිකයින්ට අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා කාර්යාංශය විසින් ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් අවශ්‍ය පහසුකම් සහිතව කම්කරු සුභසාධන අංශ සඳහා අනුයුක්ත කල යුතුයි. මෙම වියදම් කම්කරු සුභසාධන අරමුදල පිහිටුවීමේ පරමාර්ථ වලට අදාල වන බැවින් සුභ සාධන අරමුදලේ වියදම් ලෙස ගිණුම්ගත කර ඇත . | කාර්යාංශ පනතෙහි 48 (1) වගන්තිය ප්‍රකාරව කම්කරු සුභසාධන අරමුදලින් කලහැකි වියදම් පමණක් එම අරමුදලින් වැය කල යුතුය. |
| (iv)පනතේ **II** කොටසේ **17** වන වගන්තියේ **3** වන උප වගන්තිය | කාර්යාංශ අරමුදල් වැය කළහැකි අරමුණුවලට පටහැනිව, විධිමත් අනුමැතියකින් තොරව කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමේ හා හදිසි අනතුරු වන්දි ලබාදීමේ රක්ෂණ ක්‍රමයක් 1995 වසරේ සිට ක්‍රියාත්මක කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී කාර්යාංශ ආදායමින් එකතුව රු.44,287,888 ක් මෙම රක්ෂණ ක්‍රමය යටතේ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට වැයකර තිබුණි. | මීට අදාල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | කාර්යාංශ පනතෙහි සඳහන් විධි විධාන වලට අනුකූලව කටයුතු කල යුතු අතර සුභසාධක යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් අනුමැතියක් ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(v)46(1) වගන්තිය** . | කම්කරු සුභසාධන අරමුදල නමින් වෙනම බැංකු ගිණුමක් මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව ඇති කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි | කාර්යාංශයේ සාමාන්‍ය අරමුදල් රැස්කිරීම සඳහා බැංකු ගිණුම් 03 ක් පවත්වාගෙන යනු ලබයි මෙම රැස්කිරීමේ ගිණුම්වල මුදල් කාර්යාංශ අරමුදලට අදාලව සහ සුබ සාධන අරමුදලට වෙන් වෙන් වශයෙන් ගිණුම් තැබීම නිවැරදිව සිදුකරනු ලබයි. | කාර්යාංශ පනතේ සඳහන් පරිදි කම්කරු සුභසාධන අරමුදලට අදාල ගනුදෙනු සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන යායුතුය. |
| **(ආ) මුදල් රෙගුලාසි 103 (1) (ආ), 104 (1) හා PED/RED/2015/08 පොදු (i) 04.1 (ආ) ඡේදය** | 2017 වර්ෂයේ ජනවාරි සිට 2018 වර්ෂයේ ජූලි 31 දක්වා මාස 19 ක කාලය තුල කාර්යාංශය සතු වාහන 26 ක් අවස්ථා 43 කදී අනතුරට ලක්වී තිබු අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ සිදුකර නොතිබුණි. රක්ෂණ හිමිකම් ඉල්ලුම් කිරීමේ ලිපිගොනු 20 ක නියැදි පරීක්ෂාවෙන් අනාවරණය වූ පරිදි ඉහත කී කාලපරිච්ඡේදය තුල සිදු වූ අනතුරු 34 කින් 14 ක් සම්බන්ධයෙන් රියදුරු විසින් ලිඛිතව ආයතනය දැනුවත් කර නොතිබුණ අතර අනතුරු 27 ක් පොලිසියට වාර්තා කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර ඉදිරියේදි එම අඩුපාඩු නිවැරදි කරගැනීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන අනතුරු පිළිවඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. එමෙන්ම රක්ෂණ ආවරණය ලැබීම තුළින් ආයතනයට පාඩුවක් සිදුවී නොමැති බවට තීරණය කල නොහැකි අතර රක්ෂණ වාරික ගෙවීම, හිමිකම් නොපෑමේ ප්‍රසාද දීමනා අහිමිවීම, අනතුරු හේතුවෙන් වාහනයේ ඵලදායී ජීවිත කාලයට වන හානිය පිළිබඳවද අවධානය යොමු විය යුතුය. |
| **(ඇ)2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | චක්‍රලේඛයෙහි සඳහන් සීමාව ඉක්මවා කාර්යාංශය විසින් ආපදා ණය ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම ණය ශේෂයන්ගේ එකතුව රු. 325,149,295 ක් වී තිබුණි. රු. 500,000 කට වැඩි ආපදා ණය ශේෂ 137 ක් හා රු. 1,000,000 ඉක්ම වූ ණය ශේෂ 04 ක් ඉහත ශේෂයට ඇතුලත් වී තිබුණි. | මේ සඳහා අනුමැතිය ඉල්ලමින් අමාත්‍යංශ ලේකම් මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ලිපි යොමුකර ඇත.ඊට අදාලව 2018 ඔක්තෝබර් 15 දිනැති අංක PE/NEB/SLBFE/GEN/2018 දරන පිළිතුරු ලිපිය ලැබී ඇත. | අදාල ලිපියෙන් චක්‍රලේඛ සීමාව ඉක්මවා ආපදා ණය ගෙවීම සඳහා අනුමැතිය ලැබී නොමැති අතර සේවක ණය සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කල යුතුය. |
| **(ඈ)2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | 2015 වර්ෂයේ අපහරණය කිරීමට නිර්දේශ කර තිබු වාහන 27 කින් වාහන 15 ක් විගණන දිනය වූ 2019 නොවැම්බර් 01 දින වන විටත් අපහරණය කිරීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි. | මෙම වාහන වලින් 05 ක් විකුණා ඉවත් කර ඇති අතර එක් වාහනයක් අළුත්වැඩියා කර භාවිතයට ගෙන ඇත. ඉතිරි වාහන අපහරණය කිරීමට කටයුතු කරමින් පවතී. | අපහරණ ක්‍රියාවලිය ප්‍රමාදයකින් තොරව කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ මෙහෙයුම් මූල්‍ය ප්‍රතිඵලය රු. 1,166,607,206 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු. 882,369,779 ක ලාභයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 284,237,427 ක වර්ධනයක් විය. මෙම වර්ධනයට ආදායම රු. 443,408,908 කින් වැඩිවීමට සාපේක්ෂව කාර්යමණ්ඩල වියදම රු. 162,037,987 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ ආදායම සියට 32 කින් වැඩි වීමට දූත මණ්ඩල ආදායම රු. 329,906,466 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. එමෙන්ම පෙර වර්ෂයට සාපේක්ෂව සෙස් ආදායම රු. 35,677,209 ක්, පුහුණු ආදායම් රු. 33,656,127 ක් සහ විදේශ විනිමය ලාභ රු. 164,663,032 ක් වැඩිවීමද ඉහත ප්‍රවනතාවයට හේතු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ වියදමද පෙර වර්ෂයට සාපේක්ෂව රු.322,921,859 කින් වැඩි වී තිබුණ අතර ඒ සඳහා කාර්ය මණ්ඩල පිරිවැය රු. 162,037,987 ක්, පොදුකාර්ය වියදම් රු.72,939,927 ක් සහ මෙහෙයුම් වියදම් රු. 62,022,190 ක් වැඩිවීම හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 වසරේ සිට 2016 ජනවාරි මාසය දක්වා කාලසීමාවට අදාලව සේවක අර්ථ සාධක අරමුදල් ගණනය කිරීමේදී කාර්යාංශයේ සේවකයන්ට ගෙවන ලද ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් කම්කරු කොමසාරිස්ගේ උපදෙස් අනුව සේව්‍ය හා සේවක යන දෙපාර්ශවයේම දායක මුදල් කාර්යාංශයෙන් ගෙවීමට සිදුවී තිබුණි. ඒ අනුව එකතුව රු.47,912,231 ක පමණ පාඩුවක් කාර්යාංශයට සිදු වී තිබුණි. | විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණයන් නිවැරදි වේ. සේවක අර්ථ සාධක මුදල් ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව අදාල කරගත යුතුද නැද්ද යන්න පැහැදිලි සඳහනක් නොතිබීම නිසා ජීවන වියදම් දීමනාව සේවක අර්ථ සාධක අරමුදල් ගණනය කිරීමේදී මඟ හැරී තිබුණි. | නිලධාරීන්ගේ නොසැලකිලිමත්කම හේතුවෙන් මෙම පාඩුව කාර්යංශයට සිදුවී ඇති අතර ඒ සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම පාඩු අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කාර්යාංශය යටතේ ක්‍රියාත්මක වන විදේශ දූත මණ්ඩලවල කම්කරු සුභසාධන අංශ 16 සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් හෝ බඳවා ගැනීමේ පරිපාටියක් නොමැතිව 2018 දෙසැම්බර් 31 දිනට නිළධාරීන් 135 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. එම නිළධාරීන්ගේ වැටුප්, දීමනා හා අනෙකුත් පහසුකම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල එකතුව රු.663,811,831 ක් වැයකර තිබුණු අතර අනෙකුත් යටිතල පහසුකම් සහ රඳවියන්ගේ සෘජු වියදම් වෙනුවෙන් රු. 80,771,306 ක් පමනක් වැයකර තිබුණි. මේ අනුව දූත මණ්ඩලවල මුළු වියදමින් සියයට 89 ක් කාර්ය මණ්ඩලය වියදම් වෙනුවෙන් වැය කර තිබුණි. | විදේශ දූත මණ්ඩල වල රාජ්‍යතාන්ත්‍රික නිළධාරීන් පත් කිරීමට අදාලව සකස් කල නව බඳවාගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තුමෙන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු සූදානම් කර ඇත.<br><br>විදේශ ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව හා සුබ සාධනය සැලසීම ප්‍රමුඛ කාර්යය කරගනිමින් විදේශ දූත මණ්ඩල වෙත කාර්යය මණ්ඩලය අනුයුක්ත කර ඇති අතර ඔවුන්ට අවශ්‍ය පහසුකම් කාර්යාංශය විසින් සැපයිය යුතුයි. | කාර්යාංශ පනතට අනුව විදේශ දූත මණ්ඩල සඳහා වන පොදු කාර්යය සහ සේවක වැටුප් සහ දීමනා කාර්යාංශ අරමුදල් මගින් වැයකල යුතු අතර කම්කරු සුභ සාධන අරමුදල් වලින් එම වියදම් දැරීම සඳහා විධිමත් අනුමැතියක් ලබාගත යුතුයි. එමෙන්ම කම්කරු සුභසාධන අරමුදල ආරම්භ කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ)1988 වර්ෂයේ සිට ආරම්භ කර තිබූ විගමණික ශ්‍රමික දායක අරමුදල ආරම්භ කිරීමේ අරමුණු පැහැදිලි වන කිසිදු ලිඛිත තොරතුරක් කාර්යාංශය සතුව නොතිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට විගමණික ශ්‍රමිකයන් 1,573 කට අයත් රු.7,954,452 ක ශේෂයක් පැවතුණි. එහෙත් ඊට අයත් ආයෝජන සහ ලැබිය යුතු වටිනාකම්වල එකතුව රු.5,775,029 ක් පමණක් වූයෙන් එම වගකීම පියවීමට ප්‍රමාණවත් වත්කම් අරමුදල සතුව නොතිබුණි. මෙම අරමුදලෙහි කළමනාකාරීත්වය සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙලක් නොතිබූ බැවින් අරමුදල අකර්මන්‍ය තත්ත්වයට පත්වී තිබුණි. | ශේෂ පත්‍රයෙහි සඳහන් වන සෑම වගකීමකටම සමාන ආයෝජන වටිනාකමක් පැවතිය යුතුයැයි නියත නියමයක් නොමැති බව සඳහන් කරමි. කාර්යාංශයේ ජංගම හා ජංගම නොවන වගකීම් යටතේ රුපියල් බිලියන 5.2 ක් ගෙවීමට තිබුණත් ඊට සාපේක්ෂව වටිනාකම රු.බිලියන 16.5 ක වත්කම් පවතී. ඒ අනුව ඉහත කී අරමුදලෙහි වත්කම් පියවීමට ප්‍රමාණවත් අරමුදල් නොමැති බවට දක්වා ඇති ප්‍රකාශය සමඟ එකඟවිය නොහැකි වේ. | මෙම අරමුදලට දායක වූ ශ්‍රමිකයන්ට තම දායක මුදල හා ප්‍රතිලාභ ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)1990/1991 ගල්ෆ් යුද්ධය හේතුවෙන් එම කලාපයේ රැකියාවන් හි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට වන්දි ගෙවීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසමෙන් ලැබී තිබූ වන්දි වලට අදාල අරමුදල් ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.3,184,109,533 ක් වූ අතර එම වන්දි හිමියන්ට ගෙවිය යුතු මුදල රු.251,453,848 ක් විය. මෙම වන්දි මුදල් කාර්යාංශයට ලැබී දැනට වසර 20 කට ආසන්න කාලයක් ගතවී තිබුණත් අදාල ප්‍රතිලාභින් හදුනා ගෙන ගෙවීමට කටයුතු කිරිමෙන් තොරව ආයෝජනය කර ආදායම් ඉපයීමට කටයුතු කර තිබුණි. එසේම අතිරික්ත අරමුදල් සම්බන්ධයෙන්ද කළමනාකාරිත්වය විසින් කිසිදු තීරණයක් ගෙන නොතිබුණි. | වන්දි කොමිසමෙන් ලද මුදල ගෙවීම් කටයුතු ආරම්භ කරන තෙක් තාවකාලික තැන්පතුවල රදවා උපයාගෙන ඇති පොලී මුදල් ආදාල අරමුදල වෙත බැර කර ඇත. වන්දිලාභීන් 948 ක් සඳහා තව දුරටත් ගෙවිය යුතු වන්දි වටිනාකම රුපියල් මිලියන 251 කි. ඉතිරි වන්දි හිමිකරුවන් වන්දි ඉල්ලීම් ඉදිරිපත් කල හොත් ගෙවීම සඳහා මෙම මුදල් තවදුරටත් තබාගෙන ඇත. | වන්දි හිමිකරුවන් තවදුරටත් ඉදිරිපත් නොවේ නම් ඒ බව තහවුරු කරගෙන අතිරික්ත අරමුදල් නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයි. |
| (ඈ)ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සහ කාර්යාංශයේ සහයෝගිතාවයෙන් විගමණික සේවකයන් සඳහා ක්‍රියාත්මක වූ නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ, 2018 සැප්තැම්බර් 20 දින වන විට විගමණිකයන් 12,078 දෙනෙකු සඳහා සමෘද්ධි බැංකුව මගින් රු.මිලියන 3,557 ක ණය මුදලක් ලබා දී තිබුණි. ඉන් විගමණිකයන් 1,573 දෙනෙකු වෙත ණය ලබාදීමේ කොන්දේසිවලට පටහැනිව හා කිසිදු ඇපයක් තබා නොගෙන ලබා දී තිබූ රු.මිලියන 360.27 ක ණය ගෙවීම පැහැරහැර තිබුණි. මේ වන විට එම යෝජනා ක්‍රමය අකර්මන්‍යව පවතින අතර ගිවිසුම ප්‍රකාරව කාර්යාංශය නමින් රු.මිලියන 100 ක් තැන්පත් කිරීම වෙනුවට ලංකා බැංකුවේ සමෘද්ධි අධිකාරිය නමින් රු.මිලියන 100ක් තැන්පත් කිරීම හේතුවෙන් ඊට අදාල පොලියද 2014 වර්ෂයේ සිට කාර්යාංශයට ලැබී නොතිබුණි. | ලංකා බැංකුවේ තැන්පත් කර ඇති රු. මිලියන 100 ක මුදල හා ඊට අදාල පොලිය ආපසු කාර්යාංශයට ලබාගැනීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දැනුම්දී ඇත. එමෙන්ම රටවිරු ණය ලබාගෙන මියගොස් ඇති හා පූර්ණ අකර්මණ්‍යතාවයට පත්ව ණය අයකරගැනීම අපහසු වී ඇති ණය ලාභීන්ගේ ණය ශේෂ ඉහත මුදලට ලැබෙන පොලියෙන් අයකරගැනීම සඳහා අනුමැතියක් ලබාදී ඇත .ඉතිරි මුදල් අය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳ සලකා බැලීමෙන් පසු වැඩසටහන් සැලසුම් කල යුතුය. මෙම මුදල් නිරවුල්කර ගැනීමට අවශ්‍ය කඩිනම් පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) විදේශ රැකියාවක නියුක්තව සිටි බව ලිඛිතව සනාථ කල නොහැකි එහෙත් නැවත සංක්‍රමණය වීමට බලාපොරොත්තු වන ශ්‍රමිකයන්ට, තමා පෙර රැකියාවෙහි නිරත වූ රටෙහි භාෂාව හොඳින් කථා කිරිමේ හැකියාව පරීක්ෂාකර දින 10 ක පුහුණුකාලයක් නිමාකර කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ ගත වීමට අවස්ථාව ලබා දී තිබුණි. කාර්යාංශය විසින් විදේශ රැකියා නියෝජිත ආයතන වල ඉල්ලීම මත එම පාඨමාලා කාලය අවස්ථා 02 කදී දින 07 ක් සහ දින 02 ක් දක්වා අඩුකර තිබුණි. මීට අදාලව කාර්යාංශයේ පන්නිපිටිය පුහුණු මධ්‍යස්ථායේ පවත්වන ලද පාඨමාලා පිළිබඳ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු තවදුරටත් අනාවරණය විය.<br>(i) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා කාර්යාංශයේ පුහුණු අංශයේ නිලධාරියකු සහභාගී වීම වෙනුවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩල 18 ක් සඳහා කාර්යාංශයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ සහභාගි වී තිබුණි.<br>(ii)භෞතික විගණන පරීක්ෂණයට භාජනය වූ 2019 ජුලි 11 දින පවත්වන ලද පුහුණු වැඩසටහනට සහභාගී වු 20 දෙනෙකුගෙන් 05 දෙනෙකුට අරාබි භාෂාව කතාකිරීමේ හැකියාව නොතිබුණි. එහෙත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අරාබි භාෂාව කතා කල හැකි බවට ව්‍යාජ සහතිකයක් ලබා දී තිබුණි.<br>(iii)මෙම පාඨමාලාව හදාරා විගමණය වූ විගමණිකයින් 77 දෙනෙකුගෙන් 67 දෙනෙකු පෙර විගමණිකයන් නොවන බවට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතියට අනුව තහවුරු වී තිබුණි. | ජාතික විගණන කාර්යාලය විසින් සිදු කරන ලද විමර්ශනයට අදාල වාර්ථාවේ දක්වා ඇති කරුණු සැලකිල්ලට ගෙන සහ මෙම වැඩසටහන අසාර්ථක වැඩසටහනක් මෙන්ම මෙවැනි වැඩසටහන් මනා විනිවිධභාවයෙන් විධිමත්ව සිදු කිරීමට නිළධාරීනගේ පාලනය තුල පමණක් කළ නොහැකිව එය අතික්‍රමණය වන අවස්ථා ඇති බැවින් මෙම පුහුණු වැඩසටහන මේ වන විට ප්‍රතිපත්තියක් ලෙස නවතා ඇත. | විගමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය නොසලකා, විදේශ රැකියා නියෝජිත ආයතන වල ඉල්ලීම පරිදි කාර්යාංශය කටයුතු කිරීම කාර්යාංශය ආරම්භ කිරීමේ අරමුණු වලට පටහැනිව කටයුතු කිරීමක් බැවින්, එම තත්වය වෙනස් විය යුතුය. විගණන පරීක්ෂණයට භාජනය වූ මෙම පුහුණු වැඩසටහන සඳහා ශ්‍රමිකයින් තෝරා ගැනීමේදී සහ වැඩසටහන් පැවැත්වීමේ දී සිදුවී ඇති අක්‍රමිකතාවයන්ට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගත යුතුය. |
| (ඊ) 2013 වර්ෂයේ සිට කාර්යාංශයට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන ඕමාන් තානාපති කාර්යාලය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අයවිය යුතුව තිබූ එකතුව රු.67,568,640 ක කුලී මුදල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ආදායමින් කපා හැර තිබුණි. | ලැබියයුතු ආදායම පිළිබඳ අවිනිශ්චිත තත්වයක් පැවතීම මත ආදායම වැඩිපුර දැක්වීමක් සිදුවන බැවින් ආදායමක් ලෙස ගිණුම්වල ඇතුලත් නොකරන ලදි. මේ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කර ඇත. | මෙම කුලී මුදල් අය නොවීමට හේතු ඉදිරිපත් කර එම ආදායම් කපා හැරීමට අවශ්‍ය අනුමැතිය ලබාගත යුතුයි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විදේශ රැකියා ක්ෂේත්‍රය තුල සිදුවන විවිධ අක්‍රමිකතා පාලනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් මත කාර්යාංශයේ විශේෂ විමර්ශණ ඒකකය ආරම්භ කර 2018 දෙසැම්බර් 31 දින වන විට පොලිස් නිළධාරීන් 17දෙනෙකු ඇතුලත් කාර්යය මණ්ඩලය 36 දෙනෙකු එයට අනුයුක්ත කර තිබුණි. විගණන නියැදි පරීක්ෂණයකට භාජනය වූ 2017 සහ 2018 වර්ෂවල මාස 13 ක කාලපරිච්ඡේදය තුල විදේශ රැකියා ලබා දෙන බවට පොරොන්දුවී වටිනාකම රු.108,463,384 ක මුදල් වංචා කිරීම් වලට අදාල පැමිණිලි 274 ක් එම ඒකකය වෙත ලැබී තිබුණි. විදේශ රැකියා ලබාදීමට පොරොන්දු වූ බවට ලිඛිතව තහවුරු කල නොහැකි වූ බැවින් එම පැමිණිලි අදාළ ප්‍රදේශවල පොලිස් ස්ථාන වෙත යොමු කර තිබුණි. එසේ යොමුකල පැමිණිලි 20 කින් 19 කටම විසඳුම් ලැබී නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණයකදී ආනාවරණය විය. | විශේෂ විමර්ශන ඒකකයේ රාජකාරි කටයුතු පිළිබඳව පසු විපරම් කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් සහකාර පොලිස් අධිකාරිවරයෙකු පත්කර තිබේ. ප්‍රාදේශීය පොලිස් ස්ථානය වෙත යොමු කරන පැමිණිලි විභාග කිරීම, අදාල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිගේ හා එම පොලිස් ස්ථාන භාර සහකාර පොලිස් අධිකාරිවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ පවතින බැවින් එකී පැමිණිලි සම්බන්ධයෙන් පසුවිපරම් කිරීම අවශ්‍ය නොවේ. | විදේශ රැකියා ක්ෂේත්‍රය තුල පවතින විවිධ අක්‍රමිකතා පාලනය කිරීමේ අරමුණින් කැබිනට් මණ්ඩල නිර්දේශ මත මෙම ඒකකය ආරම්භ කර ඇත. එබැවින්, සිදුවී ඇති මූල්‍ය හා වෙනත් අක්‍රමිකතා පිළිබඳ කාර්යාංශයට පැමිණිලි ලැබීමෙන් පසු එම පැමිණිලි අදාල පොලිස් ස්ථාන වලට යොමු කිරීමෙන් පසු අදාල වින්දිතයින්ට සාධාරණ විසඳුමක් ලැබෙනවාද යන්න පිළිබඳ පසු විපරම් කටයුතු එම ඒකකය මඟින් සිදුකල යුතුය. |
| (ආ)කාර්යාංශ පනතට අනුව රැකියා සඳහා විදේශගතවන ශ්‍රමිකයන් පුහුණු කිරීම මඟින් කාර්යාංශයට ආදායම් ඉපයීමට හැකියාවක් නොමැති වුවත් කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ඒ තුළින් රු.74,985,198 ක ලාභයක් උපයාගෙන තිබුණි. එසේම පුහුණු ගාස්තු තීරණය කිරීමට විධිමත් ක්‍රමවේදයක් නොතිබුණු බැවින් අවශ්‍යතාවය ඉක්මවා පුහුණු ගාස්තු අයකර තබූ අවස්ථා පැවතුණි. | කාර්යාංශ පනතේ ප්‍රතිපාදන අනුව පුහුණු කිරීම සඳහා ගාස්තු අයකිරීමේ හැකියාව පවතින අතර එම ගාස්තු අයකර ඇත්තේද පදනමක් ඇතිවය. මේ පිළිබඳ අවසාන නිගමනය වන්නේ කාර්යාංශ විසින් කම්කරු සුභසාධන අරමුදල පවත්වාගෙන යාමට අවශ්‍ය ගාස්තු අයකිරීම තවදුරටත් සිදුකරන බවය. | කාර්යාංශය විසින් කරන ලද පැහැදිලි කිරීම්වල දක්වා ඇති පරිදි කාර්යාංශ පනතේ ඒ ඒ වගන්තිවල විගමණික ශ්‍රමිකයන් පුහුණු කිරීම සඳහා ගාස්තු අයකල හැකි බව සඳහන් කර නැත. කෙසේ වුවද කාර්යාංශ පනතෙහි 48(ඇ) වගන්තියේ ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා බඳවාගනු ලැබූ ශ්‍රී ලාංකිකයන් පුහුණු කිරීම සහ හුරු කිරීම සම්බන්ධයෙන් දරන සියලු වියදම් කම්කරු සුභසාධන අරමුදලෙන් දැරිය යුතුය. එමෙන්ම ගාස්තු අයකර පුහුණු කිරීමට හෝ ආදායම් ඉපයීමට කාර්යාංශයට හැකියාවක් ද නොමැත. |

| | | |
|---|---|---|
| (ඇ) ජාතික ඉතිරි කිරීමේ බැංකු ගිණුමකින් ලංකා බැංකුවේ ජංගම ගිණුමට මාරු කරන ලද රු. 23,000,000 ක මුදල දින 07 ක් ප්‍රමාද වී අදාල ගිණුමට බැරවී තිබුණු අතර එම කාලය තුල අදාල ගිණුම් 2 හිම මෙම මුදල සටහන් නොවී පැවති බව විගණනයේදී අනාවරණය විය. එහෙත් ඒ පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් කාර්යාංශය විසින් ගෙන නොතිබුණි.අදාල ජංගම ගිණුමෙහි එම කාලපරිච්ඡේදය තුල රු. මිලියන 43 ඉක්මවූ ශේෂයක් පැවති බැවින් මෙසේ මුදල් මාරු කිරීමේ අවශ්‍යතාවය කුමක්ද යන්න පැහැදිලි නොවුණි. | ලංකා බැංකු ශාඛාවේ පවත්වාගෙන යන ජංගම ගිණුම මඟින් ගනුදෙනු විශාල ප්‍රමාණයක් සිදුවන බැවින් අවම වශයෙන් රු. මිලියන 20-25 ක පමන ශේෂයක් නිරතුරුවම පවත්වාගෙන යා යුතුයි. | මෙම මුදල අදාල ගිණුමට නියමිත දිනයේදී බැර නොවීමට හේතුව පරීක්ෂා කළ යුතු අතර බැංකු ගිණුම් මෙහෙයවීම පිළිබඳව ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යායුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුවේට් හා කටාර් රාජ්‍යයන් වෙත රැකියා සඳහා ශ්‍රමිකයන් යොමුකිරීමේදී එම ශ්‍රමිකයන්ට අදාලව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහතිකය මත විදේශ කටයුතු අමාත්‍යාංශයට යොමුකළ යුතුව තිබූ පොලිස් නිෂ්කාශන වාර්තා සාමාන්‍ය ක්‍රමවේදයට අනුව අදාල පොලිස් ස්ථාන මගින් ගෙන්වා ගැනීමෙන් තොරව, රැකියා නියෝජිත ආයතන මගින් ලබාගෙන සහතික කර විදේශ කටයුතු අමාත්‍යාංශයට යොමු කිරීමට කටයුතු කර තිබුණි. රත්නපුර පොලිස් ස්ථානයෙන් අස්ථානගත වී ඇති බවට වාර්තා වී තිබූ පොලිස් වාර්තා පොතකින් නිකුත් කරන ලද ව්‍යාජ පොලිස් නිෂ්කාශන සහතික 35 ක් කාර්යාංශය විසින් ඉහත සඳහන් පරිදි සහතික කර විදේශ කටයුතු අමාත්‍යාංශයට යොමු කර ඇති බව පසුව හෙලිදරව් වී තිබුණි. එසේ ව්‍යාජ සහතික ඉදිරිපත් කර තිබූ රැකියා නියෝජිත ආයතනය පිළිබඳව 2019 ජනවාරි 17 දින කාර්යාංශය දැනුවත් වී තිබුණද එම ආයතනයට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට විගණන දින වූ 2019 නොවැම්බර් 20 දින වනවිටත් කාර්යාංශය කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කාර්යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරින් සමඟ සාකච්ඡාකර පොලිස් නිෂ්කාශන වාර්තා සෘජුව විදේශ කටයුතු අමාත්‍යාංශයට ගෙන්වා ගැනීමට කටයුතු සිදුකර ඇත. සිද්ධියට සම්බන්ධ විදේශ රැකියා ඒජන්සි සමාගම සම්බන්ධයෙන් තොරතුරු කාර්යාංශයට නොලැබීම මත එම ආයතනයේ රැකියා ඇනවුම් සඳහා අනුමැතිය ලබාදීම අත්හිටුවා නැත. | මෙම රැකියා ඒජන්සි සමාගම සම්බන්ධව කාර්යාංශ පනතෙහි 31 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ ආරම්භ කරන ලද 2017 අප්‍රේල් මාසයේදී වැඩ නිමකිරීමට සැලසුම් කල කතරගම නිවාඩු නිකේතනයේ ඉදිකිරීම් කටයුතු රු. 119,617,558 ක පිරිවැයක් දරමින් නිම කර 2019 අගෝස්තු 28 භාරදුන් බව විගණනයට දන්වා තිබුණි. එහෙත් ප්‍රමාණවත් ජල පහසුකම් නොමැති වීම මත එම නිවාඩු නිකේතනය විගණන දිනය වූ 2019 නොවැම්බර් 01 දින වන විටත් භාවිතයට ගැනීමට නොහැකිව පැවතුණි. | කාර්යාංශය විසින් 2019 අගෝස්තු 24 වන දින කතරගම සංචාරක බංගලාවේ යතුරු භාර ගන්නා ලදි. නමුත්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් මේ වන තෙක් ලිඛිතව ගොඩනැගිල්ල භාර දීමට අදාළ ලියවිලි හා සැලසුම් කාර්යාංශය වෙත ලබා දී නොමැත.එමෙන්ම ජලය සපයා ගැනීම සඳහා අවශය කටයුතු සිදුකරමින් පවතී. | මෙම ගොඩනැගිල්ලෙහි දැනට පවතින අඩුපාඩු කඩිනමින් සකස් කර පරිහරනයට ගත යුතුය. |

### 3.6 වෙනත් සංවිධාන වලට මුදාහල සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදුලි සංදේශ , විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත නිලධාරීන් දෙදෙනෙකු, ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය වෙත නිලධාරීන් හතර දෙනෙකු හා පළාත් ආණ්ඩුකාර කාර්යාලය වෙත නිලධාරීන් දෙදෙනෙකු ලෙස කාර්යාංශයේ නිලධාරීන් අට දෙනෙකු 2018 වර්ෂයේදී වෙනත් ආයතන වෙත මුදාහැර තිබුණි. | සේවා අවශ්‍යතාවය සලකා බලා කාර්යාංශය විසින් කාර්ය මණ්ඩලය එම ආයතන වෙත අනුයුක්ත කර ඇත. | කාර්යාංශය සඳහා අනුමත සහ බඳවාගත් කාර්යය මණ්ඩලය වෙනත් ආයතන වලට මුදා හැරීම කාර්යාංශ කටයුතු වලට බාධාවක් බැවින් එම නිලධාරීන් නැවත කාර්යාංශයේ කටයුතු සඳහා අනුයුක්ත කල යුතුය. |